# සාමාන්‍ය සමයේ දොළොස් වන සතිය
# සෙනසුරාදා

## පළමුවන කියැවීම

උත්පත්ති පොතෙන් ගත් පාඨයෙකි.

උත්පත්ති 18 :1–15

"සමිඳාණන්ට බැරි දෙයක් ඇද්ද? සාරා පුතෙකු ලබන්නී ය."

තවද, සමිඳාණන් වහන්සේ මම්රේහි ආලෝන අරඹ ළඟ දී ආබ්‍රහම්ට දර්ශනය වූ සේක. ඔහු දවාලේ තද අව්ව රස්නය ඇති වේලාවේ කූඩාරමේ දොරකඩ වාඩි වී සිටියේය. ඔහු නෙත් ඔසවා බැලූ විට, පුදුමයකි තමාට තුදුරින් මිනිසුන් තිදෙනෙකු සිටිනු දිටීය. ඔවුන් දුටු විට ඔහු ඔවුන් හමු වීමට ගොස් හිස නමා වැඳ වැටුණේය. මෙසේ ආචාර කොට "ස්වාමීනි, කරුණාකර ඔබේ දාසයා ළඟ නැවතී යන මෙන් ඉල්ලමි. මට අවසරයි, මම වතුර ටිකක් ගෙනෙන්නෙමි. ඔබ පාද සෝදාගෙන, ගස යට විවේක සුවය විඳින්න. මම ද කෑම ටිකක් ගෙනෙන්නෙමි. එය වළඳා ඔබේ ගත සිත සනසා ගෙන මේ ගමන යන්න. ඔබේ දාසයාගේ නිවසට ඔබ පැමිණියේ ඒ නිසා යැ"යි කීය. ඔව්හු ද "ඔබ කී ලෙස කරන්නෙමු" යි පිළිතුරු දුන්හ.

ආබ්‍රහම් ද වහා කූඩාරම තුළට ගොස් සාරාට කථා කොට, "හොඳම පිටි ගෝණියක් ඉක්මණින් ගෙන එයින් ටිකක් අනා උදුන මත තබා රොටී පුළුස්සන්නැ"යි කීය. තවද ඔහු ගව පට්ටියට දුව ගොස් කදිම ළපටි වස්සකු ගෙන දාසයාට දුන්නේය. දාසයා ද ඌ ඉක්මණින් පිළියෙළ කළේය. තවද, ආබ්‍රහම් වෙඬරු හා කිරි ද පිසින ලද වහු මස් ද ගෙන

ආගන්තුකයන් ඉදියෙහි තැබීය.  ඔවුන් ඒවා වළඳන විට ඔහු ද ගස යට ඔවුන්ට සමීපව සිටියේය.

එවිට ඔව්හු ආබ්‍රහම්ට කතා කොට “නුඹේ බිරිඳ සාරා කොහේදැ”යි ඇසූහ. “ඈ කූඩාරම තුළ ය”යි ඔහු උත්තර දුනි.  එවිට අමුත්තා කතා කොට, “දරු උපතට නියම කාලය පැමිණි විට සත්තකට ම මම නොවරදවා නුඹ වෙත ආපසු එමි.  එවිට නුඹේ භාර්යාව වන සාරා පුතෙකු ලබන්නී ය”යි කීය.  අමුත්තාට පිටුපසින් පිහිටි කූඩාරමේ දොරකඩ සිටි සාරාට එය ඇසිණි.

ආබ්‍රහම් ද සාරා ද මහලුව හොඳටම වයස් ගතව සිටියහ.  සාරාට ඔසප් වීම ද නැවතී තිබිණි.  එබැවින් සාරා “දරු උපතක් නොලැබිය හැකි මහලු වියට පැමිණි පසුත් මා අඹු–සැමි ප්‍රීතිය භුක්ති විඳින්නට ද?  ඇරත් මාගේ සැමියාත් දැන් මහල්ලෙකි” යි කියා ගනිමින් සිනාසුණාය.  එවිට සමිඳාණන් වහන්ස් ආබ්‍රහම්ට කතා කොට “මහලු වියට පැමිණි පසු හැබැවටම දරු උපතක් ලැබිය හැකිදැ”යි කියා ගනිමින් සාරා සිනාසුණේ ඇයි?  සමිඳාණන් වහන්සේට බැරි දෙයක් ඇද්ද?  දරු උපතට නියම කාලය පැමිණි විට මම නුඹ වෙත ආපසු එමි.  එවිට සාරා පුතෙකු ලබන්නී ය”යි වදාළ සේක.  සාරා ද බිය වී “මා සිනාසුණේ නැතැ”යි කීවාය. එහෙත් අමුත්තා “නැහැ නුඹ සිනාසුණා ය”යි කීය.

දේව වාක්‍යය එසේය.

| පිළිතුරු ගීය |
| --- |

ලූක් 1: 46–50, 53–55

පිළිතුර: සමිඳාණෝ අපට දයාව පෙන්වන සේක.

ගීය:

"මාගේ හද සමිඳුන් උසස් ලෙස පසසයි. මාගේ සිත මා මිදුම්කාර දෙවිඳුන් ගැන උදන් අනයි.

කුමක් නිසා ද එතුමාණෝ සිය දාසියගේ දීනතාව කුළුණු පාමින් සළකා වදාළ සේක. හැම පරපුරක් ම මෙතැන් සිට 'භාග්‍යවන්තී ය'යි මට කියනු ඇත. පරාක්‍රමයාණෝ මා උදෙසා මහත් දේ කළ සේක. 'පරිශුද්ධයාණෝ' යනු එතුමන්ගේ නාමය ය.

එතුමන්ගේ දයාව සිය බැතිමතුන් කෙරේ පරපුරෙන් පරපුරට පැතිරේ. එතුමාණෝ සාගිනි වුවන් යහපත් දෙයින් සතප්පා, ධනවතුන් හිස් අතින් හරවා යැවූ සේක.
අප පියවරුන් වූ ආබ්‍රහම්ට හා එම පරපුරට සදහට ම පොරොන්දු වූ ලෙසට සිය සේවක ඉශ්රායෙල් සෙනඟ හට දයාව පෙන්වා පිහිට වූ සේක.

## සාධුකාරය

ආලේලූයා! ආලේලූයා!
අපගේ මිදුම්කාරයාණන් වන ක්‍රිස්තුස් ජේසුස් වහන්සේ මරණයේ බලය බිඳ දමා ජීවනයේ අමරණීය භාවයත් සුබ අස්න මගින් හෙළිකර වදාළ සේක.
ආලේලූයා!

නොහොත්

ආලේලූයා! ආලේලූයා!
සමිඳාණෝ ම අපේ දුබලකම් දරා ගත්හ.
අපේ රෝ දුක්බර උසුලා ගත් සේක.
ආලේලූයා!

## සුවිශේෂය

සුවිශේෂක මතෙව් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

මතෙව් 8 : 5–17

"එකම ඉශ්‍රායෙල් මිනිසෙකු තුළවත් මෙතරම් මහත් ඇදහිල්ලක් මම නුද
ුටිමි."

ජේසුස් වහන්සේ කපර්ණාවුමට ඇතුල් වූ කල එක් ශාතාධිපතියෙක් උන් වහන්සේ වෙත අවුත්, කන්නලවු කරමින් "ස්වාමිනී, මාගේ මෙහෙකරුවා අංසබාග රෝගයෙන් දැඩි වේදනා විඳිමින් ගෙයි ඔත්පලව සිටී ය"යි කීය. "මම අවුත් ඔහු සුව කරමි"යි උන් වහන්සේ ඔහුට වදාළ සේක. ශාතාධිපතියා උත්තර දෙමින් "ස්වාමිනී, ඔබ මාගේ නිවසට

පැමිණීමට තරම් මම නොවටිමි. වචන මාත්‍රයක් පැවසුව මැනව. එවිට මාගේ මෙහෙකරුවා සුව වනු ඇත. මන්ද මම ද බලය ලත් අය යටතේ සිටින මිනිසෙක්මි. මා යටතේ ද භේවායෝ සිටිති. මා කෙනෙකුට 'යන්නැ'යි කී කල ඔහු යන්නේය. කෙනෙකුට 'එන්නැ'යි කී කල ඔහු එන්නේය. මාගේ දාසයාට 'මෙය කරන්නැ'යි කී කල ඔහු එය කරන්නේ යැ"යි කීවේය.

ජේසුස් වහන්සේ ඒ අසා විස්මිතව තමා පසු පස්සේ ආ අයට කතා කොට, "සැබැවින්ම මම ඔබට කියමි. එකම ඉශ්රායෙල් මිනිසෙකු තුළවත් මෙතරම් මහත් ඇදහිල්ලක් මම නුදුටිමි. තවද මම ඔබට කියමි. පෙර අපර දෙදිගින් බොහෝ දෙනෙක් අවුත් ආබ්‍රහම් ද ඊසාක් ද ජාකොබ් ද සමඟ ස්වර්ග රාජ්‍යයෙහි අසුන් ගන්නෝය. එහෙත් රාජයයට හිමිකම් ඇත්තෝ පිටත අන්ධකාරයෙහි හෙළනු ලබන්නෝය. එහි හැඬීම ද දත් මිටි කෑම ද වන්නේ ය"යි වදාළ සේක. ජේසුස් වහන්සේ ශතාධිපතියාට කතා කොට "යන්න, ඔබ අදහා ගත් ලෙසම ඔබට වේවා'යි වදාළ සේක. ඒ මොහොතේදීම මෙහෙකරුවා සුවපත් විය.

ජේසුස් වහන්සේ පේදුරුගේ ගෙට ඇතුල් වූ කල ඔහුගේ බිරිඳගේ මව උණ රෝගයෙන් ඔත්පලව සිටිනු දැක ඇගේ අත ඇල්ලූ සේක. එවිට උණ බැස ගියේය. ඈ නැගිට උන් වහන්සේට උපස්ථාන කළාය.

සවස් වූ කල යක්ෂාවේශ වූ බොහෝ දෙනෙක් උන් වහන්සේ වෙත ගෙනෙන ලද්දෝය. උන් වහන්සේ වචන මාත්‍රයකින් අශුද්ධාත්මයන් දුරු කළ සේක. රෝගාතුර වූ සියල්ලන් සුවපත් කළ සේක. මෙසේ වූයේ උන් වහන්සේම අපේ දුබලකම් දරා ගත් සේක. අපේ රෝ දුක්බර උසුලා ගත් සේකැ"යි
ඉසයියස් දිවැසිවරයා විසින් කියන ලද කීම ඉටුවන පිණිස ය.

සුවිශේෂ වාක්‍යය එසේය.